**මහනුවර මහා නගර සභාවේ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ ගිනි නිවාරණ සේවා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2023**

1987 අංක 19 දරන මහා නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරිය) 40(1) වගන්තිය යටතේ ගිනි නිවාරණ සේවා නිලධාරි තනතුර සඳහා මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය (කොන්ත්‍රාත් පදනම මත) ඃ

1.1 බඳවා ගැනීමේ පොදු කොන්දේසි ඃ

1.1.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

1.1.2 අයදුම්කරුවන් මහනුවර මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි පිරිමි අයදුම්කරුවන් විය යුතුය. (අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03ක) කාලයක් මෙම මහනගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු බවට සනාථ කෙරෙන ලියවිලි සම්මුඛ පරීක්ෂණයේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.)

1.1.3 අයදුම්කරුවන්, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා වයස අවු. 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයන් හට මෙම තනතුරු සඳහා ඉල්ලුම් කළ නොහැක.

1.1.4 අයදුම්කරුවන්, විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුය.

1.1.5 සෑම අපේක්ෂකයෙකු ම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

1.1.6 අඩි 5යි අඟල් 4ක අවම උසකින් යුක්ත විය යුතුය.

1.1.7 කි. ග්‍රෑම් 56ක අවම බරකින් යුක්ත විය යුතුය.

1.1.8 පපුව අඟල් 32 ට (ප්‍රසාරණය කළ විට) නොඅඩු විය යුතුය.

1.1.9 කායික මානසික යෝග්‍යතාවය සේවය කිරීම සඳහා සුදුසු බවට රජයේ පිළිගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

- සටහන

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

1.2 *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි ඃ*

1.2.1 මෙම තනතුර මහනුවර මහා නගර සභාවේ ගරු මහා සභා අනුමැතිය මත සේවා අවශ්‍යතාවය සලකා පිහිටුවා ගනු ලබන තනතුරක් වන අතර මහා නගර සභා ආඥාපනතේ (40) 1, (ආ), (ආ), (ඇ) (ඇ) යන විධිවිධානයන්ට යටත් වේ. මෙම තනතුර විශ්‍රාම වැටුප් රහිතය. ගරු මහා සභාව විසින් හෝ නාගරික කොමසාරිස්වරයා විසින් සේවා අවශ්‍යතාවය මත නිර්ණය කරනු ලබන කාල සීමාවන් සඳහා සේවයේ නියුක්ත කරවනු ලබයි. එසේම මෙම තනතුරු සම්බන්ධව ගරු මහා සභාව හෝ නාගරික කොමසාරිස්වරයා ඉදිරියේ දී ගනු ලැබිය හැකි තීරණයන්ට මෙහි සඳහන් කරුණු යටත් වේ.

1.2.2 මාසික දීමනාව ඃ ගිනි නිවාරණ සේවා නිලධාරි තනතුර සඳහා හිමි මාසික දීමනාව රු. 29,500.00 කි.

2. තනතුර හා අධ්‍යාපන සුදුසුකම් :

| අනු. අංකය | තනතුරු නාමය | බඳවා ගැනීමට අවශ්‍ය උපරිම තනතුරු ගණන | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | අධ්‍යාපන සුදුසුකම් | රාජකාරී ස්වභාවය |
|---|---|---|---|---|---|
| 01 | ගිනි නිවාරණ සේවා නිලධාරී | 12 | ගිනි නිවීම් පුහුණුව පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමකි.<br><br>බර වාහන පැදවීමේ රියදුරු බලපත්‍රය ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැළකේ | අධ්‍යයන පොදු සහතික පත්‍ර සා. පෙළ විභාගයේ දී අඩු වශයෙන් වාර දෙකකදී සිංහල/දෙමළ/ගණිතය විද්‍යාව ඇතුළු විෂයයන් (6)ක් සමත් වී තිබිය යුතු අතර ඉන් විෂයයන් 05 ක් එක් අවස්ථාවකදී සමත් වී තිබිය යුතුය. | ගිනි කැඳවීමකට යාමට හෝ ගිනි නිවීම් සේවාව වෙත පවරා ඇති වෙනත් සේවාවක් ඉටු කිරීම සඳහා ඕනෑම අවස්ථාවක සූදානමින් සිටීම. |

** ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ දී මහනුවර මහා නගර සභාවේ පවතින සේවක අවශ්‍යතාවය සළකා ඒ අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

03. බඳවා ගැනීමේ ක්‍රමය : 100% විවෘත පදනම මත

ඉදිරිපත් කර ඇති අයදුම්පත් අතුරින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කර ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ.
ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයේ දී පහත අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

| පරීක්ෂාකර ලකුණු ලබාදෙන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ. |
| 02 | ක්ෂේත්‍රයට අදළව සම්පූර්ණ කර ඇති වෘත්තීය පුහුණු පාඨමාලා | 20 | |
| 03 | ක්ෂේත්‍රයට අදළ කරුණු සම්බන්ධව ප්‍රශ්න කිරීම | 30 | |
| 04 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා | 30 | |
| | මුළු ලකුණු | 100 | |

04. අයදුම් කළයුතු ආකාරය :

4.1 මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි (A4) 12 x 8'27 ප්‍රමාණයේ පිටුවල දෙපසම භාවිතා කරමින් අයදුම්පතක් සකස් කර **2023** ජනවාරි මස **15** දිනට හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

4.2 ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ අයදුම් කරන තනතුර අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

4.3 නියමිත දිනට නොලැබෙන අයදුම්පත් දැනුම දීමකින් තොරව ප්‍රතික්ෂෙ කරනු ලැබේ.

4.4 අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

01. උප්පැන්න සහතිකය
02. අධ්‍යාපන සහතිකය
03. පදිංචිය සනාථ කිරීමේ ග්‍රාම නිලධාරී විසින් මාස තුනක කාලයක් තුල නිකුත් කරන ලද සහතිකය
04. මෑතකදී ලබාගත් චරිත සහතිකය
05. වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
06. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත

(මුල් පිටපත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු බැවින් මුල් පිටපත් එවීමෙන් වළකින ලෙස කාරුණිකව දන්වමි.)

කේ. කේ. ජී. අයි. ඩී. පී. විජේතිලක,
මහනුවර නාගරික කොමසාරිස්,

2022 දෙසැම්බර් මස 22 වැනි දින,
මහනුවර මහා නගර සභාවේ දී ය.